# විෂයමාලා ආවරණය සඳහා යෝජිත වැඩසටහන

## පළමුවන ශ්‍රේණිය (දෙවන වාරය)

## 2022

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## යෝජිත වැඩසටහන සඳහා උපදෙස් මාලාව

2022 පාසල් වර්ෂය සඳහා පාසල්වල දෛනික පරිපාලන කටයුතු හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව සාමාන්‍ය පරිදි පවත්වා ගැනීම උදෙසා කඩිනම් පියවර ගැනීමට සිදු වී තිබේ.

ඒ අනුව මෙම අධ්‍යයන වර්ෂය තුළ දී අනිවාර්යයෙන් ම අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත හඳුනා ගෙන ඊට අනුව කාලය වෙන් කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම මෙමගින් අපේක්ෂිත ය.

ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපන අවධියේ එක් එක් ශ්‍රේණිවල දෙවන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් අන්තර්ගතවලින් අත්‍යවශ්‍ය ඉගෙනුම් කොටස් පමණක් මෙමගින් ඉදිරිපත් කරනු ලබයි. මෙම විෂය කොටස් සාධනය වූ විට දෙවන වාරයට අවශ්‍ය ඉගෙනුම් අවස්ථා සඳහා සුදුසුකම් ලබන බව වැඩිදුරටත් සඳහන් කරමු.

එමෙන් ම දැනටමත් දෙවන වාරයට අදාළ යම් පමණක විෂය කොටස් ප්‍රමාණයක් ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව විවිධතාවලින් යුතු ව පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වී ඇත. එසේ වුවද අප විසින් යෝජනා කරනු ලබන්නේ පළමුවන වාරයට අදාළ ව සිසුන් විසින් අත්‍යවශ්‍යයෙන් ම අත්පත් කරගත යුතු විෂය කොටස් ය. මෙම යෝජිත විෂය කොටස්වලින් ද ඔබ පාසලේ ආවරණය වූ විවිධ විෂයය කොටස් තිබිය හැකි ය. එසේ වූ විට දී එම කොටස් අතහැර ඊළඟට ඇති විෂයය කොටසේ සිට පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමට අප විසින් යෝජනා කරන්නෙමු.

එමෙන් ම එක් එක් විෂය අන්තර්ගත සඳහා යෝජිත කාලය ඔබ පන්ති කාමරයේ සිටින සිසුන්ගේ සාධනය මත නම්‍යශීලී ව හා සාධාරණ ව වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත. එනමුත් යෝජිත විෂය අන්තර්ගතවලින් අඩු නොකොට ඒ සියල්ල මනා ලෙස සම්පූර්ණ කිරීමේ වගකීම ද ඔබ සතු ය.

එක් එක් විෂය සඳහා ගුරුමාර්ගෝපදේශයට අනුව දෙවන වාරයට නිර්දිෂ්ට විෂය අන්තර්ගත මාර්ගගත ක්‍රමයට හෝ ඉතාමත් සරල පැහැදිලි කිරීම්වලින් අනතුරු ව නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් ලෙසට හෝ ආවරණය කළ හැකි ය. එසේ වුවත් නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දෙන ක්‍රියාකාරකම් සිසුන්ට අනවශ්‍ය බරක්, පීඩනයක් නොවන ආකාරයට ලබා දීම ද ඔබ සතු වගකීමකි.

එමෙන් ම අප විසින් යෝජනා කරනු ලබන අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත ඒ ඒ විෂය තක්සේරුවට අනුව විධිමත් ලෙස තක්සේරු කිරීම ඔබ සතු වගකීමකි. මීට අමතර ව මාර්ගගත ක්‍රමයට සහ නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමයට ආවරණය කරනු ලබන විෂය කොටස්වලට අදාළ ව සිසුන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් නැවත පන්ති කාමරයට ගෙන්වා ගත යුතු ය. අනතුරු ව ඒවා සිසුන් ඉදිරියේ පරීක්ෂා කර අවශ්‍ය ප්‍රතිපෝෂණ සහ ඉදිරිපෝෂණ ලබා දී විෂය තක්සේරුවට අනුව තක්සේරු කිරීම ද සිදු කළ යුතු ය.

ඒ අනුව සෑම විෂයයක ම අදාළ වාරයට අපේක්ෂිත ඉගෙනුම් පල කරා සියලු ම සිසුන් ළඟා කරවීම ඔබ සතු වගකීමකි. කෙසේ වුවත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන් සෞඛ්‍ය සම්පන්න ව, ආරක්ෂිත ව, ප්‍රීතිමත් ව සහ ක්‍රියාශීලී ව ඒ සඳහා යොමු කරලීමේ වගකීම ද ඔබ සතු ය. ඒ අනුව ශ්‍රී ලාංකේය ප්‍රාථමික අධ්‍යාපනය හදාරන සිසුන්ගේ ඉගෙනුම් කාර්යය ශක්තිමත් හා ඵලදායී කරලීමේ උතුම් අරමුණින් මේ සියල්ල ක්‍රියාත්මක කිරීමට ඔබට ශක්තිය ලැබේවා යි පතමු.

**මව්බස - සිංහල**
**පළමුවන ශ්‍රේණිය (දෙවන වාරය)**

පළමුවන ශ්‍රේණියේ දෙවන වාරය සඳහා ආවරණය කළ යුතු අත්‍යවශ්‍ය විෂය අන්තර්ගත පහත පරිදි යෝජනා කෙරෙයි. ඒ අනුව දී ඇති අනුක්‍රමයට අදාළ ව ඉගෙනුම් පල සාධනයට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කළ යුතු ය.

පළමුවන ශ්‍රේණියේ දෙවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර පළමුවන ශ්‍රේණියේ පළමුවන වාරයට අදාළ අකුරු භාවිතයේ නිරවද්‍යතාව, වචන අසා ලිවීම සහ වචන ශබ්දනගා කියවීම මැන බැලීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුවාගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය. ඉන් පසු ව පළමුවන ශ්‍රේණියේ දෙවන වාරය සඳහා අප විසින් යෝජනා කරනු ලබන විෂය අන්තර්ගත සඳහා යොමු විය හැකි ය.

පළමුවන ශ්‍රේණියේ දෙවන වාරය සඳහා යෝජිත විෂය අන්තර්ගත පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී සිදු කළ යුතු අතර එම ක්‍රියාකාරකම්වලට අදාළ අභ්‍යාස පුනරීක්ෂණ ක්‍රියාකාරකම් ලෙසට ද මාර්ගගත ක්‍රමයට සහ නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ද ලබා දිය හැකි ය.

## පළමුවන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | L1<br>අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි. | පවසන දේ අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | කතන්දරවලට සවන් දීම | ක්‍රියාකාරකම 03 | 33,34 | මි.30 |
| | S1<br>අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි. | | පින්තූර කතාවලට සවන් දීම | ක්‍රියාකාරකම 04 | 34 | මි.30 |
| | | | නිදහසේ කතන්දර කීම | ක්‍රියාකාරකම 07 | 35 | පැය.01 |
| | | | පින්තූර කතාවලි-න් කියවෙන දේ පිළිබඳ කතා කිරීම | ක්‍රියාකාරකම 08 | 35<br>කියවීම් පොත පිටු අංක 1,2,3<br>වැඩ පොත පිටු අංක 17 | පැය.01 |

| පළමුවන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
| අකුරු පැහැදිලි ව හා නිවැරදි ව සරල වැකියක් පිටපත් කරයි. | R1<br>කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි.<br><br>W1<br>කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් ලියයි. | ■ ශබ්ද විභේදන හඳුනා ගෙන අකුරු, වචන, වාක්‍යාංශ සහ වැකි උච්චාරණය කරයි. | ■ අකුරු හඳුන්වා දීම<br>-ආරෝහණ අක්ෂර 16<br>-අවරෝහණ අක්ෂර 11 | ක්‍රියාකාරකම 02 | 38<br>වැඩ පොත පිටු අංක 20-23 | පැය.08 |
| | | ■ අකුරු, වචනවල විවිධතා හඳුනා ගෙන නිවැරදි ව ලියයි. | ■ පිලි රහිත අකුරු කියවීම සහ ලිවීම | ක්‍රියාකාරකම 02 | 38, 39 | පැය.02 |
| | | ■ නැවතීමේ ලකුණට අනුගත ව වචන තුනේ සරල වැකි කියවයි. ලියයි. | ■ පිලි රහිත වචන කියවීම සහ ලිවීම | ක්‍රියාකාරකම 02 | 39 | පැය.02 |
| | | | ■ සරල වැකි කියවීම සහ ලිවීම | ක්‍රියාකාරකම 02 | 40 | පැය.02 |
| | | | ■ හල් ලකුණ හඳුන්වා දීම | කොඩිය සහ රැහැන | 40 - 44 | පැය.02 |
| | | | ■ ඇලපිල්ල හඳුන්වා දීම, වචන කියවීම සහ ලිවීම | ක්‍රියාකාරකම 01 | 44, 45 | පැය.02 |

| පළමුවන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
| | | | ■ කෙටි ඇදපිල්ල හඳුන්වා දීම, වචන කියවීම සහ ලිවීම | ක්‍රියාකාරකම 01 | 46, 47 | පැය.02 |
| | | | ■ දික් ඇදපිල්ල හඳුන්වා දීම, වචන කියවීම සහ ලිවීම | ක්‍රියාකාරකම 01 | 47 | පැය.02 |
| | | | ■ කෙටි ඉස්පිල්ල හඳුන්වා දීම, වචන කියවීම සහ ලිවීම | ක්‍රියාකාරකම 01 | 47,48 | පැය.02 |
| | | | ■ දික් ඉස්පිල්ල හඳුන්වා දීම, වචන කියවීම සහ ලිවීම | ක්‍රියාකාරකම 01 | 48 | පැය.02 |
| | | | ■ කෙටි පාපිල්ල හඳුන්වා දීම, වචන කියවීම සහ ලිවීම | ක්‍රියාකාරකම 01 | 48, 49 | පැය.02 |
| | | | ■ දික් පාපිල්ල හඳුන්වා දීම, වචන කියවීම සහ ලිවීම | ක්‍රියාකාරකම 01 | 49 | පැය.02 |
| | | | ■ (ඉහත එක් එක් පිල්ල යෙදුණු වචන කියවීම පොතෙන් සොයා කියවීමට සහ ලිවීමට අවස්ථාව දීම) | | | පැය.01 |
| | | | ■ (ඉහත එක් එක් පිල්ල යෙදුණු වචන ලිවීමේ අභ්‍යාස සඳහා වැඩ පොතේ උචිත අභ්‍යාසවලට යොමු කිරීම) | | | පැය.01 |
| | | | | | මුළු කාලය | පැය35 |

## ගණිතය
## පළමුවන ශ්‍රේණිය (දෙවන වාරය)

ගණිතය විෂයමාලාවේ පළමුවන ශ්‍රේණියේ දෙවන වාරයට අදාළ අත්‍යවශ්‍ය ම ඉගෙනුම් සංකල්ප සාධනය සඳහා අවශ්‍ය විෂය අන්තර්ගතය වෙන වෙන ම මෙහි ඇතුළත් කර ඇත. සිසුන් පීඩනයට පත් නොවන අයුරින් ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා මෙය උදවු කර ගන්න. මෙහි යෝජනා කර ඇති කාලය උචිත පරිදි ගළපා ගනිමින් ගුරු මාර්ගෝපදේශයේ දක්වා ඇති මගපෙන්වීම් ද ප්‍රයෝජනයට ගෙන ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

පළමුවන ශ්‍රේණියේ දෙවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර පළමුවන වාරයේ දී ගණිතය විෂය සඳහා අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය විෂය කොටස් සිසුන් තුළ  සාධනය වී ඇද්දැයි පරීක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්කරගෙන ඇති ද යන්න තහවුරු කරගන්න. ක්‍රියාකාරකම්වලට උචිත අයුරින් ගණිතය වැඩ පොතේ අභ්‍යාස සඳහා ද සිසුන් යොමු කරන්න.

සමහර නිපුණතාවලට අදාළ ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ සිදු කිරීමෙන් පසු ව එම සංකල්ප තව දුරටත් තහවුරු කිරීම සඳහා නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ද අභ්‍යාස සඳහා සිසුන් යොමු කළ හැකි ය.

පළමුවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 1. වස්තු දෙකක දිග සසඳයි. | 1.1 වස්තු දෙකක් එක ළඟ තබා දිග සසඳයි.<br>1.2 අභිමත මිනුමක් භාවිත කර දිග සසඳයි.<br>1.3 වස්තුවල දිග හා කොට යන වචන භාවිත කරයි. | ■ වස්තුවල දිග සැසඳීම | පාඩම 12ඃ<br>සියලු ම ක්‍රියාකාරකම් | 26, 27 | පැය 02 |
| | 2. විවිධ ඝනවස්තුවල ලක්ෂණ හා ස්වභාව අනුව ආකෘති ගොඩනගයි. | 2.1 විවිධ ඝනවස්තුවල ලක්ෂණ හා ස්වභාව විස්තර කරයි.<br>2.2 හැඩයෙන් සමාන ඝනවස්තු හඳුනා ගෙන වෙන් කරයි.<br>2.3 විවිධ ඝනවස්තුවල ස්වභාව අනුව ආකෘති ගොඩනැගීම සඳහා යොදා ගනියි. | ■ ඝනවස්තු හඳුනා ගැනීම<br>■ ආකෘති ගොඩ නැගීම | පාඩම 13ඃ<br>ක්‍රියාකාරකම 1, 2, 4 | 28 සහ 29 | පැය 02 |

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 3. අසමාන බර සහිත වස්තු දෙකක බර සසඳයි. | 3.1 වස්තු දෙකක් බර අඩු සහ බර වැඩි වශයෙන් සසඳයි.<br><br>3.2 අසමාන බර සහිත වස්තු දෙකක බර සසඳා බර අඩු හෝ බර වැඩි වශයෙන් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ■ අසමාන බර සහිත වස්තු අතට ගෙන සහ තැටි තරාදියක් මගින් සැසඳීම | පාඩම 14ඃ ක්‍රියාකාරකම 1 සහ 3 | 30, 31 | පැය 02 |
| | 4. 4 සිට 6 තෙක් සංඛ්‍යා හඳුනා ගෙන භාවිත කරයි. | 4.1 4, 5 සහ 6 ද්‍රව්‍ය/රූප සංඛ්‍යාවකට අදාළ සංඛ්‍යාංක කියවයි.<br><br>4.2 4, 5 සහ 6 සංඛ්‍යාංක නිවැරදි ව ලියයි. | ■ 4, 5 සහ 6 ද්‍රව්‍ය/රූප ප්‍රමාණවලට අදාළ සංඛ්‍යාංක හඳුනා ගැනීම, කියවීම සහ ලිවීම. | පාඩම 15ඃ ක්‍රියාකාරකම 1 සිට 3 | 32, 33 | පැය 02 |
| | 5. එක ම වර්ගයේ ද්‍රව්‍ය/රූප 10ක් නිවැරදි ව ගණන් කරයි. | 5.1 1 සිට 10 තෙක් සංඛ්‍යානාම නිවැරදි ව අනුපිළිවෙළින් කියයි.<br><br>5.2 එක ම වර්ගයේ ද්‍රව්‍ය 10 ක් නිවැරදි ව ගණන් කරයි.<br><br>5.3 එක ම වර්ගයේ රටාවකට පිහිටි රූප 10ක් නිවැරදි ව ගණන් කරයි. | ■ එක ම වර්ගයේ ද්‍රව්‍ය සහ රූප 10ක් ගණන් කිරීම. | පාඩම 16ඃ ක්‍රියාකාරකම 1 සිට 3 | 34, 36 | පැය 02 |

පළමුවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| හැඩය සහ පිහිටීම වෙනස් වුවත් අඩංගු ප්‍රමාණය වෙනස් නොවන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 6. සංඛ්‍යාවක අවිචලතාව හඳුනා ගනියි. | 6.1 සංඛ්‍යාවෙන් සමාන ද්‍රව්‍ය කට්ටල දෙකකින් එකක ද්‍රව්‍යවල වර්ගය හැඩය තරම හෝ පාට අනෙකට වඩා වෙනස් වුව ද ඒවා එකට එක ගළපා ප්‍රමාණයෙන් සමාන බව ආදර්ශනය කරයි.<br><br>6.2 කට්ටලයක ඇති ද්‍රව්‍ය සංඛ්‍යාව කවර හැඩයකට තැබුව ද ද්‍රව්‍ය සංඛ්‍යාවේ වෙනසක් නොවන බව පිළිගනියි.<br><br>6.3 එකම ද්‍රව්‍ය කට්ටලයක ද්‍රව්‍ය කවර ආකාරයකට තැබුව ද ද්‍රව්‍ය සංඛ්‍යාව වෙනස් නොවන බව පිළිගනියි. | ▪ ද්‍රව්‍ය ඇසුරෙන් සංඛ්‍යාවක අවිචලතාව | පාඩම 17: ක්‍රියාකාරකම 1 සිට 4 | 37 සිට 40 | පැය 02 |
| රූප රටා නිරීක්ෂණය කර ඊළඟට ආ යුතු රූපය හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 7. රටාවකට පිහිටි ද්‍රව්‍ය/රූපවල රටාව හඳුනා ගෙන රටාව තවදුරටත් ගොඩනගයි. | 7.1 රටාවකට පිහිටි ද්‍රව්‍ය දෙකක/තුනක රටාව හඳුනා ගෙන තවදුරටත් රටාව ගොඩනගයි.<br><br>7.2 ද්‍රව්‍ය/රූප වර්ග දෙකක් හෝ තුනක් හෝ මගින් රටා ගොඩනගයි. | ▪ ද්‍රව්‍ය රටා<br>▪ රූප රටා | පාඩම 18: ක්‍රියාකාරකම 1 සිට 3 | 41 සිට 42 | පැය 02 |

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 8. එකිනෙකට වෙනස් භාජන දෙකක ධාරිතාව අල්ලන ද්‍රව ප්‍රමාණ ඇසුරෙන් සසඳයි. | 8.1 තරම වෙනස් භාජන දෙකක ජලය අඩුවෙන් අල්ලන භාජනය සහ ජලය වැඩියෙන් අල්ලන භාජනය ලෙස සසඳයි.<br><br>8.2 කුඩා භාජනයක් ආධාරයෙන් භාජන දෙකක ධාරිතාව සසඳයි.<br><br>8.3 අල්ලන ද්‍රව ප්‍රමාණය කුඩා භාජනයකින් මැන භාජන දෙකක ධාරිතා සසඳයි.<br><br>8.4 විවිධ ක්‍රම භාවිතයෙන් භාජන දෙකක ධාරිතා මැන සසඳයි. | ▪ තරම වෙනස් භාජනවලට අල්ලන ද්‍රව ප්‍රමාණ ජලය යොදා ගෙන මැන සැසඳීම. | පාඩම 19: ක්‍රියාකාරකම 1 සිට 5 | 43 සිට 45 | පැය 2 මි.30 |
| ජ්‍යාමිතික හැඩ හඳුනා ගෙන නම් කරයි. | 9. ජ්‍යාමිතික හැඩතල භාවිතයෙන් නිර්මාණ කරයි. සරල රටා ගොඩනගයි. | 9.1 වෘත්තය, ත්‍රිකෝණය, සමචතුරස්‍රය සහ සෘජුකෝණාස්‍රය යන ජ්‍යාමිතික හැඩතල හඳුනා ගෙන නම් කරයි.<br><br>9.2 ජ්‍යාමිතික හැඩතල භාවිතයෙන් නිර්මාණ ගොඩනගයි.<br><br>9.3 ජ්‍යාමිතික හැඩතල අඳියි.<br><br>9.4 ජ්‍යාමිතික හැඩතල භාවිතයෙන් රටා ගොඩනගයි. | ▪ වෘත්තය, ත්‍රිකෝණය, සමචතුරස්‍රය සහ සෘජුකෝණාස්‍රය හඳුනාගැනීම.<br>▪ හැඩතල ඇසුරෙන් නිරමාණ සහ රටා. | පාඩම 20: ක්‍රියාකාරකම 1 සිට 4 | 46 සිට 48 | පැය 02 |

පළමුවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 10. 7 සිට 9 තෙක් සංඛ්‍යා හඳුනා ගෙන භාවිත කරයි. | 10.1 7 සිට 9 තෙක් සංඛ්‍යාවක් ද්‍රව්‍ය/රූප ඇසුරින් නිරූපණය කරයි.<br><br>10.2 7 8 සහ 9 නිරූපණය කිරීම සඳහා භාවිත වන සංඛ්‍යාංක හඳුනා ගෙන කියවයි,<br><br>10.3 ද්‍රව්‍ය/රූප සංඛ්‍යාවට ගැලපෙන සංඛ්‍යාංකය තෝරයි.<br><br>10.4 7 සිට 9 තෙක් සංඛ්‍යාංක නිවැරදි ව ලියයි. | ▪ 7 සිට 9 තෙක් සංඛ්‍යා නාම සහ සංඛ්‍යාංක හඳුනා ගැනීම. | පාඩම 21: ක්‍රියාකාරකම 1 සිට 4 | 49 සහ 50 | පැය 02 |
| | 11. 1 සිට 9 තෙක් ක්‍රම සූචක සංඛ්‍යා හඳුනා ගෙන භාවිත කරයි. | 11.1 1 සිට 9 තෙක් ක්‍රම සූචක සංඛ්‍යා නම් කරයි.<br><br>11.2 9 තෙක් වූ ක්‍රම සූචක සංඛ්‍යා නිවැරදි ව භාවිත කරයි. | ▪ 1 සිට 9 තෙක් ක්‍රම සූචක සංඛ්‍යා | පාඩම 22: ක්‍රියාකාරකම 1 සිට 3 | 51 සහ 52 | පැය 01 මි.30 |
| | | | | | මුළු පැය ගණන | පැය 22 |

**පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්**
**පළමුවන ශ්‍රේණිය (දෙවන වාරය)**

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ පළමුවන ශ්‍රේණියට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතය මෙහි දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී පරිසර ගවේෂණය, විද්‍යාත්මක සංකල්ප භාවිතය සිසුන් සමග සිදු කළ යුතු අතර මෙහි සඳහන් අනෙකුත් ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් විශේෂයෙන් සෞන්දර්ය, ක්‍රීඩා හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් නිවෙස පාදක ව සිදු කිරීමට ද සිසුන් යොමු කළ යුතු ය. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලට අදාළ කවි, ගීත ආදියෙහි අර්ථය ගායනයට පෙර සිසුන්ට පැහැදිලි කරමින් ඊට අදාළ ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

චිත්‍ර ඇඳීමේ දී, ඇඹීමේ දී, ආකෘති ගොඩනැගීමේ දී සිසුන්ගේ ඇති දක්ෂතාවලින් ම සිය නිර්මාණ එළිදැක්වීමටත් ඒවා අගය කරමින් ඔවුන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය කිරීමටත් උත්සුක විය යුතු ය. නිවෙස් පාදක ව ක්‍රියාකාරකම් සිදු කරන සෑම අවස්ථාවක දී ම සිසුන්ගේ හැකියා වර්ධනය වන පරිදි ඊට අදාළ ක්‍රියාකාරකම් ඔවුන් විසින් ම කිරීම සඳහා යොමු කළ යුතු ය. සිසු නිර්මාණ පාසලට පැමිණෙන දිනයන්හි රැගෙන ඒමට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ගන්න. කණ්ඩායම් ලෙස හෝ තනි තනි ව ප්‍රදර්ශනය කිරීමටත් ඒවා අගය කිරීමටත් කටයුතු කරන්න.

සිසුන් තුළ යහපත් ආකල්ප ඉස්මතු වන ආකාරයට සෑම ක්‍රියාකාරකමක් ම ගොඩනගා ගන්න. **ආදරය, කරුණාව, දයාව වැනි සංවර්ධනාත්මක චිත්තවේග දියුණු කිරීමටත්** කේන්තිය, හිංසාව, රිදවීම වැනි අහිතකර චිත්තවේග පාලනය කිරීමටත් සෑම ක්‍රියාකාරකමකින් ම සමාජ හිතවාදී චර්යා ඉස්මතු කිරීමටත් වග බලා ගන්න.

**අන්මත ඉවසීම, අන් අයට ගරු කිරීම, නායකත්වයට ගරු කිරීම, සාමූහික ව කටයුතු කිරීම** ආදී සමාජ කුසලතා වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට කටයුතු කරන මෙන් තව දුරටත් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිමු.

මෙහි ඉදිරිපත් කර ඇති තේමා යටතේ ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි විෂයයට අදාළ ක්‍රියාකාරකම් සිදු කරන්න. එහි දී ගුරු මාර්ගෝපදේශයේ දෙන ලද උපදෙස් අනුව කටයුතු කරන්න. ගීතවලට සහ වචනවලට අදාළ ශ්‍රව්‍ය පට (Audio materials) www.nie.lk - Downloads - other materials - English - ABOE මගින් ලබා ගන්න.

**පළමු වන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්**

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| පරිසරය ගවේෂණය කර තොරතුරු අනාවරණය කරගෙන ප්‍රකාශ කරයි. | අපට පෙනෙන අහස - 6 | ■ අහසේ හා අවට පරිසරයේ වෙනස්කම් සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර වාර්තා කරයි.<br><br>■ හිරු එළියෙන්, සුළඟින් හා වර්ෂාවෙන් සිදුවන බලපෑම් පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි. | ■ දිවා, රාත්‍රී අහසේ දක්නට ලැබෙන දේ නිරීක්ෂණය කර වාර්තා කරයි.<br><br>■ සුළඟ උපයෝගී කරගනිමින් ද්‍රව්‍ය අහසේ පාකර හැකි බව අත්හදා බලයි.<br><br>■ හිරු එළියේ බලපෑම නිසා පැළෑටිවල සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 01<br><br>02<br><br>03- 04 | 136<br><br>137<br><br>138 | පැය 05 |
| සෞඛ්‍යවත් ආහාර පෝෂක ගැනීමේ පුරුදු ප්‍රදර්ශනය කරයි.<br><br>පෞද්ගලික පිරිසිදුකම හා පිළිවෙල පිළිබඳ සැලකිලිමත් ව කටයුතු කරයි. | අප කන බොන දේවල් - 7 | ■ ආහාර වර්ගවල ඇති වැදගත්කම හඳුනාගනිමින් පරිභෝජනය කරයි.<br><br>■ නිරෝගී පැවැත්මක් සඳහා නිවැරදි සෞඛ්‍ය පුරුදු පවත්වා ගනියි.<br><br>■ ආහාර අපිරිසිදු වන අයුරු හඳුනාගෙන ඒවායින් ආහාර ආරක්ෂා කර ගැනීමට කටයුතු කරයි. | ■ ආහාර වේලක අඩංගු දේ නම් කරයි.<br>■ ආහාර පානවලින් අපේ ශරීරයට ලැබෙන ප්‍රයෝජන විස්තර කරයි.<br><br>■ ආහාරපාන නියමිත වේලාවට නියමිත ප්‍රමාණයෙන් පරිභෝජනය කරයි.<br><br>■ පරිභෝජනය සඳහා ස්වභාවික ආහාර තෝරා ගනියි.<br><br>■ නිරෝගී සිරුරක් පවත්වා ගැනීම සඳහා යෝග්‍ය සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි.<br><br>■ ආහාර පිරිසිදු ව තබාගැනීමට කටයුතු කරයි. | 01<br>02<br>03<br>04<br>05<br>06 | 139<br>140<br>141 | පැය 09 |

## පළමු වන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | තොරතුරු ලැබෙන හැටි - 8 | ■ සන්නිවේදනයේ දී භාවිත කරන විවිධ මාධ්‍යය හඳුනාගෙන ඒවා නිවැරදි ව හසුරුවයි.<br>■ තාක්ෂණික උපකරණ භාවිතය පිළිබඳ හැකියා ප්‍රදර්ශනය කරයි.<br>■ තොරතුරු සන්නිවේදනය සම්බන්ධ විවිධ නිර්මාණ කරයි. | ■ සන්නිවේදන මාධ්‍යය හා උපකරණ පිළිබඳ තොරතුරු වාර්තා කරයි.<br>■ සන්නිවේදනයේ දී යොදා ගන්නා තාක්ෂණික මෙවලම් භාවිත කරයි.<br>■ තොරතුරු සන්නිවේදනය සම්බන්ධ උපකරණවල ආකෘති නිර්මාණ කරයි. | 01<br>02<br>03, 04 | 144<br>144<br>145 | පැය 06 |
| පරිසරය ගවේෂණය කර තොරතුරු අනාවරණය කර ප්‍රකාශ කරයි. | වටපිටාවේ සිදුවන වෙනස්කම් - 9 | ■ පරිසරයේ සිදුවන වෙනස්කම් සහ ඒවාට සතුන් දක්වන ප්‍රතිචාර ගවේෂණය කර වාර්තා කරයි.<br>■ ස්වභාවික පරිසරයේ සිදුවන හදිසි තත්ත්වයන් පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි. | ■ වැස්සට පෙර හා පසු සමීප පරිසරයේ සිදුවන වෙනස්කම් සංසන්දනය කරයි.<br>■ අව්ව සහ සුළඟ නිසා සමීප පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණ කර වාර්තා කරයි.<br>■ වටපිටාවේ සිදුවන වෙනස්කම්වලට සතුන් දක්වන ප්‍රතිචාර නිරීක්ෂණය කර වාර්තා කරයි.<br>■ ස්වභාවික පරිසරයේ ඇති විය හැකි හදිසි තත්ත්වයන් නිසා සිදුවිය හැකි බලපෑම් වාර්තා කරයි.<br>■ සුළඟ ආධාරයෙන් ක්‍රියාකරවිය හැකි සුළං පෙත්තක් නිර්මාණය කරයි. | 01 - 05<br>08 - 10 | 147<br>148<br>148<br>150 | පැය 06 |

පළමු වන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | අපේ යහපැවැත්ම - 10 | ■ යහගුණ අගය කරමින් එම ගුණාංග පවත්වා ගෙන යාමට කටයුතු කරයි.<br>■ වගකීම් ඉටු කරමින් පොදු කටයුතු සඳහා දායකත්වය ලබා දෙයි.<br>■ නීතිරීති පිළිගනිමින් නීතිගරුක ව හැසිරෙයි. | ■ පන්ති කාමරයේ දී අන් අය කෙරෙහි ගරුත්වයෙන් යුතු ව කටයුතු කරයි.<br>■ එදිනෙදා කටයුතුවලදී නීතිගරුක හැසිරෙයි.<br>■ අවශ්‍ය අවස්ථාවලදී නායකත්ව ලක්ෂණ ප්‍රදර්ශනය කරයි. | 01 - 03<br>06, 07 | 151<br>152<br>154<br>154 | පැය 06 |
| සරල මැහුම් ක්‍රමයක් භාවිත කර රෙදි කැබලි දෙකක් මූට්ටු කරයි. | අපට ඕනෑ දේ ලැබෙන හැටි - 11 | ■ අපට උදව් ලබා දෙන අය හඳුනාගෙන ඔවුන් කෙරෙහි යහපත් ආකල්පයකින් කටයුතු කරයි.<br>■ වෙළඳපොළක ස්වභාවය හා ක්‍රියාකාරීත්වය හඳුනාගෙන වාර්තා කරයි.<br>■ තමාට ලැබුණු දේ අන්‍යයන් සමග බෙදා හදා ගැනීමේ යහපුරුදු පවත්වා ගෙන යාමට ක්‍රියා කරයි.<br>■ අපට අවශ්‍ය සමහර දෑ අපට නිෂ්පාදනය කරගත හැකි බව අවබෝධ කරනිමින් කටයුතු කරයි.<br>■ එදිනෙදා ද්‍රව්‍ය ඇසුරෙන් විවිධ නිර්මාණවල යෙදෙයි | ■ අවශ්‍යතා ඉටු කරන දෙමාපියන්, වැඩිහිටියන්, ගුරුවරුන්ගෙන් සහ මිතුරන්ගෙන් ඉටුවන සේවය පිළිබඳ යහපත් ආකල්පයකින් ක්‍රියා කරයි.<br>■ වෙළඳපොළක ක්‍රියාකාරීත්වය පිළිබඳ සිය අත්දැකීම් විස්තර කරයි.<br>■ ආහාර සඳහා අපට නිෂ්පාදනය කළ හැකි දේ ගෙවත්තේ වගා කිරීමට දායක වෙයි.<br>■ ස්වභාවික පරිසරයෙන් සපයා ගත හැකි ද්‍රව්‍ය යොදා ගෙන සකස් කර ගත් වර්ණ භාවිත කරමින් නිර්මාණ කරයි. | 01 -04<br>06, 07 | 156<br>156, 157<br>157<br>158 | පැය 07 |
| | | | | | මුළු පැය ගණන | පැය 39 |

පළමුවන ශ්‍රේණිය - දෙවන ජාතික භාෂාව

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් | ගුරු මාර්ගෝපදේශයේ සඳහන් පිටු අංකය | කාලය (පැය) |
|---|---|---|---|---|
| පන්ති කාමරයේ දී ගුරුවරයාගෙන් ලැබෙන විධානවලට අවනත ව ක්‍රියා කරයි | **எழும்புங்கள்** එලුම්බුංගල් (නැගිටින්න)<br>**இருங்கள்** ඉරුංගල් (වාඩිවෙන්න)<br>**கை தட்டுங்கள்** කෛ තට්ටුංගල් (අත්පුඩි ගසන්න)<br>**ஓடுங்கள்** ඕඩුංගල් (දුවන්න)<br>**நில்லுங்கள்** නිල්ලුංගල් (නවතින්න)<br>**துள்ளுங்கள்** තුල්ලුංගල් (උඩපනින්න) | 1-4 | 195 | පැය 2 මි 30 |
| තම සමීප යහළුවන්ගේ තොරතුරු සුහද ව විමසයි | **உங்கள் பெயர் என்ன?**<br>උංගල් පෙයර් එන්න?<br>ඔබේ නම මොකක් ද ?)<br><br>**உங்கள் ஊர் எது?**<br>උංගල් ඌර් එදු ?<br>(ඔබේ ගම කොහේ ද?)<br><br>**எனது ஊர் .....**<br>එනදු ඌර් ..........<br>(මගේ ගම .........) | 1-4 | 196 - 197 | පැය 2 මි 30 |
| | | | මුළු කාලය | පැය 05 |

**සැ.යු.**

සියලු ආගම් විෂයයන්ට අදාළ විෂය අන්තර්ගත ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති කාලයම සුදුසු පරිදි සැලසුම් කර ගැනීමට යෝජිත ය.